www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආධාර ගිවිසුම පිලිබඳ ශ්‍රී ලංකාවේ අධිකරන තීන්දුව: තියුනු දේශපාලන ආතතීන්වල සලකුනක්

## Sri Lankan court ruling over aid deal: a sign of sharp political tensions

**විජේ ඩයස් විසිනි**
**2005 අගෝස්තු 17**

පසු ගිය සිකුරාදා සිදු වූ ශ්‍රී ලංකා විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර්ගේ ඝාතනය දිවයින සිවිල් යුද්ධය කරා යලි අවතීර්න වීමේ තර්ජනය උත්සන්න කර ඇත. කෙසේ වුවද ඔහුගේ අභාවය දැනටමත් නව අර්බුදයක් කරා තල්ලුවෙමින් තිබෙන අතිශය දහනශීලී දේශපාලන තත්වයේ එක් අංශයක් පමනි.

රටෙහි උතුරු හා නැගෙනහිර පලාත්වල සුනාමි ආධාර පරිපාලනය කිරීම සඳහා ආන්ඩුව හා දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර අත්සන් කෙරුනු මූලික එකඟතාව ඇත්ත වසයෙන් ම අත්හිටුවන අතුරු තහනම් නියෝගයක් පසු ගිය මාසයේ දී ශ්‍රේෂ්ඨාධිකරනය නිකුත් කලා ය. ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය (ජේඑච්යූ) ද ඇතුලු සිංහල ස්වෝත්තමවාදී පක්ෂ විසින් දැඩි ලෙස හෙලා දකිනු ලැබූ මෙම ගිවිසුම සංස්ථාපිතයේ විවිධ කොටස් විසින් දකගනු ලැබුවේ ඇනහිට ඇති සාම සාකච්ඡා යලි ඇරඹීමට අවකාශ සලසන්නක් ලෙස ය.

ජූනි මාසයේ දී ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ හවුල් ආන්ඩුවෙන් ඉවත් වූ ජවිපෙ, පශ්චාත් සුනාමි මෙහෙයුම් කලමනාකරන ගිවිසුම (පීටොම්ස්) ව්‍යවස්ථාවට පටහැනි යැයි ප්‍රකාශ කරන ලෙස අධිකරනයෙන් ඉල්ලා සිටියහ. සැප්තැම්බර් 12 දින වන තෙක් අවසන් තීන්දුවක් ප්‍රකාශයට පත් නො කරනු ඇති අධිකරනය ගිවිසුමේ මූලික අංග ක්‍රියාත්මක වීම වලක්වා ලන අතුරු තහනම් නියෝගයක් අග්‍ර විනිශ්චයකාර සරත් එන් සිල්වා ප්‍රමුඛ ශ්‍රේෂ්ඨාධිකරන විනිසුරුවරුන් තිදෙනෙක් විසින් ජූනි 16 දා නිකුත් කරනු ලැබී ය.

පීටොම්ස් දෙසැම්බර් 26 සුනාමි ව්‍යසනයෙන් විනාශයට පත් ජීවන කොන්දේසි සහිත දස දහස් ගනනකගේ මූලික අවශ්‍යතාවන්ට කිසිදු ක්‍රමයකින් විසඳුම් ඉදිරිපත් නොකරන පාලක ප්‍රභූ තන්ත්‍රයන් අතර ගනුදෙනුවකි. එහෙත් සිංහල අධිපතිවාදය මත පදනම් වූ කොලඹ තන්ත්‍රයේ කොටස් මෙම ගිවිසුම සලකන්නේ එල්ටීටීඊයට පමනක් නොව රටෙහි ද්‍රවිඩ සුලුතරයට දුන් පිලිගත නොහැකි සහනයක් ලෙස ය.

ජාතික පාවාදීමක් ලෙස ගිවිසුම හෙලා දුටු ජවිපෙ, ජාතික අවශ්‍යතාවලට එරෙහි වන නියෝග ප්‍රත්ක්ෂේප කරන ලෙසට මිලිටරියට හා පොලීසියට බල කරති. තමන් ශ්‍රේෂ්ඨාධිකරනය වෙත ඉදිරිපත් කල පෙත්සමේ ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 39 දෙනා කියා සිටියේ ''ත්‍රස්තවාදය ප්‍රචන්ඩත්වය, මිනී මැරීම හා විනාශය සමග අනන්‍ය වූ නීතියෙන් පිලිනොගත් සංවිධානයක් වන එල්ටීටීඊය සමග අවබෝධතා ගිවිසුමකට එලඹීමට නීතිමය පදනමක් නැති බැවින්'' පීටොම්ස් ගිවිසුම කෙරෙහි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව යි.

අධිකරන තීන්දුව පාලක කවයන් අතර ඇති තියුනු බෙදීම් පිලිබිඹු කලා ය. ගිවිසුමේ කොටස් කිහිපයකට තහනමක් පැනවීම මගින් ජවිපෙ පෙත්සමේ අඩංගු දෑ පිලිගත් විනිසුරුවරුන් ජනාධිපතිගේ මූලික බලතල සඳහා අනුමතිය පල කලහ. ජවිපෙ පෙත්සම මුලුමනින්ම පිලිගනු ලැබුවහොත් දැනට ක්‍රියාත්මක වන එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව හා එල්ටීටීඊය අතර 2002 පෙබරවාරියේ දී අත්සන් තැබුනු සටන් විරාම ගිවිසුම ද ව්‍යවස්ථා විරෝධී වේ.

මෙම නඩුවේ දේශපාලනික ගම්‍යයන් පිලිබඳව සැලකිලිමත් වූ අධිකරනය, ''රජයේ අත්‍යවශ්‍ය කටයුතු කර ගෙන යාම සඳහා'' ඕනෑම ගිවිසුමක් අත්සන් කිරීමට හෝ බලාත්මක කිරීමට විධායක ජනාධිපති ලෙස කුමාරතුංගට බලය ඇතැයි සඳහන් කරමින් ඇයගේ බලතල අනුමත කලා ය. නියෝගය මෙසේ ප්‍රකාශ කලා යඃ ''රජයේ අත්‍යවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන්නා වූ ගිවිසුම්වලට එලඹීම ද, නියමිත අවස්ථාවල දී රාජ්‍යයේ ද විධායකයේ ද ආන්ඩුවේ ද ප්‍රධානියා ලෙස ජනරජය වෙනුවෙන් නීත්‍යනුකූලව ක්‍රියාත්මක වීමට ද, ජනාධිපතිනියට ඇති හැකියාව ගැන (ව්‍යවස්ථාවට අනුව) තර්ක කල නොහැක.''

පාලක සභාගයේ කොටස්කරුවකුව සිටියදී ''පීටොම්ස් ගිවිසුම අත්සන් කිරීම පිලිබඳව තමන් අඳුරේ

තැබූ බවට'' ජවිපෙ ගෙන ආ තර්කය ද අධිකරනය ප්‍රතික්ෂේප කලා ය. විධායක ජනාධිපතිධුරයේ ආඥාදායක බලතල අනුමත කරමින් ශ්‍රේෂ්ඨාධිකරනය ප්‍රකාශ කලේ ''විධායක බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය සාධනය හා ඉටු කිරීම ප්‍රමුඛව හා මූලිකව ජනාධිපතිනිය යටතේ ඇත'' යනුවෙනි. මෙම නියෝගය දීම මගින්, පීටොම්ස් ගිවිසුම අත්සන් කිරීමට පෙර පාර්ලිමේන්තුවෙන් හෝ ඇයගේ ම කැබිනට්ටුවෙන් විමසීමට අසමත් වූ කුමාරතුංගගේ ප්‍රජාතන්ත්‍රවිරෝධී ක්‍රියාවන්ට අධිකරනය රබර් මුද්‍රාව තැබී ය.

කෙසේ වුවද ඒ සමගම අධිකරනයේ අතුරු තහනම් නියෝගය සුනාමි ආධාර ගිවිසුමේ මූලික අංග අත්හිටුවා ඇත. ඉහලපෙලේ කමිටුවක්, ප්‍රාදේශීය කමිටුවක් හා දනටමත් පවතින දිස්ත්‍රික් කමිටු හරහා පීටොම්ස් ගිවිසුම පරිපාලනය කිරීමට නියමිතව තිබුනි. පුලුල් අධීක්ෂන බලතල සහිත ඉහලපෙලේ කමිටුව ආන්ඩුවෙන් එල්ටීටීඊයෙන් හා මුස්ලිම් පක්ෂවලින් එක් අයකු බැගින් අඩංගු වන පරිදි සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

බොහෝ පරිපාලනමය තීරන ගැනීමට නියමිතව තිබුනු ප්‍රාදේශීය කමිටුව ජවිපෙ විරෝධයේ ප්‍රධාන එල්ලය වීම පුදුමයට හේතුවක් නො වේ. එල්ටීටීඊ සාමාජිකයන් පස්දෙනෙක්, ආන්ඩුවෙන් දෙදෙනෙක් හා මුස්ලිම් පක්ෂවලින් තිදෙනෙක් ඇතුලත් වන මෙම කමිටුවේ සභාපතිත්වය එල්ටීටීඊයට හිමි වෙයි. එය ක්‍රියාත්මක වීමට නියමිතව තිබුනේ එල්ටීටීඊ පාලන ප්‍රදේශයේ ප්‍රධාන නගරවලින් එකක් වන කිලිනොච්චියේ සිට වීම ද වැදගත් කාරනයකි.

උතුරු හා නැගෙනහිර පලාත්වල ජනතාව මත මෙම කමිටු පටවනු ලබන ප්‍රජාතන්ත්‍ර විරෝධී ආකාරය හෝ ඒවායේ සංයුතියේ වාර්ගික පදනම සමග ජවිපෙ එකග නොවන්නේ නැත. ඒ වෙනුවට ජවිපෙට අවශ්‍යව ඇත්තේ එල්ටීටීඊයට කිසිදු ආකාරයක සාමාන්‍ය පිලිගැනීමක් ලබා නොදෙමින් දෙතොත් එය කනිෂ්ට ක්‍රියාකාරිකයෙකුගේ මට්ටමට පහත හෙලමින් ඕනෑම කමිටුවක් ස්ථිර ලෙස හා නිශ්චිත වසයෙන් ආන්ඩුවේ පාලනය යටතේ පැවතීම සහතික කරලීමට යි.

මෙම කරුන මත අධිකරනය ජවිපෙ සමග එකග වෙයි. ප්‍රාදේශීය කමිටුවේ කටයුතු ආන්ඩුවේ ම කටයුතු බව ද ඒවා එලෙසම පැවතිය යුතු බව ද නිගමනය කරමින් අධිකරනය එම කමිටුව ක්‍රියාත්මක වීම අත් හිටුවී ය. අරමුදල් කලමනාකරනය කිරීම ද පශ්චාත් සුනාමි සහන සේවා, පුනරුත්ථාපන කටයුතු, යලි ගොඩනැගීම් හා සංවර්ධන කටයුතුවලට අදාල ව්‍යාපෘති අනුමත කිරීම හා කලමනාකරනය කිරීම ද ඇතුලත් ප්‍රාදේශීය කමිටුවේ මූලික බලතල අතුරු තහනම් නියෝගය මගින් අත්හිටුවී ය.

ප්‍රාදේශීය කමිටුවට බියකින් තොරව තීරන ගැනීමට හැකි විය යුතු බව පවසමින් එය කිලිනොච්චියේ පිහිටුවීම ද තහනම් කල අධිකරනය එය සුදුසු ස්ථානයක -- එනම් රජයේ පාලන ප්‍රදේශයක -- පිහිටුවන ලෙස කියා සිටියා ය. එවැනි ප්‍රදේශවල රැස්වීම් පැවැත්වීමට බියවීමට එල්ටීටීඊ සාමාජිකයන්ට සෑම හේතුවක් ම ඇත. පසු ගිය වසර මුලුල්ලේ එල්ටීටීඊය ද රහසිගතව මිලිටරියේ පිටුබලය ලබන එල්ටීටීඊයෙන් බිඳී ගිය කන්ඩායමක් ද අතර ඝාතනයන් ඇතුලු ගැටුම් මාලාවක් සිදු වී ඇත.

ජවිපෙ ක්ෂනිකවම කියා සිටියේ අධිකරන තීන්දුව ජයග්‍රහනයක් බව යි. ''මෙම පීටොම්ස් ගිවිසුම දේශපාලනිකව හා නෛතිකව වලංගු නොවන බව අධිකරනයේ විශ්වාසය යි. මෙය දේශපාලනිකව වැලැක්වීමට අප උත්සාහ ගත් නමුත් එය සාර්ථක නොවී ය. එම නිසා එය නෛතිකව පැරදීමට අප ගත් උත්සාහයෙන් අපට ජයග්‍රහනය ලැබිනි'' යයි ජවිපෙ ලේකම් ටිල්වින් සිල්වා මාධ්‍ය හමුවක දී පැවසී ය.

දේශපාලන සංස්ථාපිතයේ හා රාජ්‍ය තන්ත්‍රයේ සැලකියයුතු කොටසකගේ පිටුබලය මෙම නියෝගයට පැහැදිලිවම තිබුනි. සන්ඩේ අයිලන්ඩ් පුවත්පතේ කතුවැකියක් ප්‍රකාශ කලේ: ''ඕනෑම ගිවිසුමක් තුල යම් හුවමාරුවක් තිබිය යුතු නමුත් ජාතික ස්වාධිපත්‍ය හා රටේ ඒකීය අඛන්ඩතාවය එහි කොටසක් විය නොහැක.'' ජනාධිපතිනියද ඇයට පෙර ඇගේ මව ද වඩාත් වැදගත් කරුනු කාරනාවලදී නෛතික උපදෙස් සඳහා සහාය ලබා ගත් එච්. එල්. ද සිල්වාගේ හැකියාවෙන් පීටොම්ස් ගිවිසුමට එරෙහිව තර්ක කිරීමට උපදෙස් ලබා ගැනීමට'' ජවිපෙට හැකි වූ බව ද එහි සඳහන් විය.

කෙසේ වුව ද පීටොම්ස් ගිවිසුම සමග ඉදිරියට යාම තම අභිප්‍රාය බව කුමාරතුංග පැහැදිලි කලා ය. ''ගිවිසුමෙන් සියයට 90ක් ම සම්පූර්න බවත් එය සමග ඉදිරියට කටයුතු කිරීමට සූදානම් බවත්'' සඳහන් කරමින් ආන්ඩුව අධිකරනයට අලුතින් දිවුරුම් පෙත්සම් ඉදිරිපත් කරන බවත් ජනාධිපති ප්‍රකාශක හරීම් පීරිස් නිවේදනය කලේ ය. අධිකරනය මගින් තහනම් කරනු ලැබූ සියයට 10 ගිවිසුමේ තීරනාත්මක කොටස නො වන්නේ දැයි විමසූ විට බැරෑරුම් මුහුනක් ආරූඪ කරගත් ජනාධිපති ප්‍රකාශකයා ''අධිකරනයේ තීන්දුව පිලිබඳව අපි අත්‍යන්තයෙන් ම සතුටු වන්නෙමු'' යයි කීය.

නඩුවේ වගඋත්තරකරුවන්ගෙන් එක් අයකු වන සහන පුනරුත්ථාපන සහ ප්‍රතිසංවිධාන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් එම්. එස්. ජයසිංහ ජුලි 29 දා ආන්ඩුව වෙනුවෙන් පෙත්සමට එරෙහිව විරෝධතා ගොනු කලේ ය.

පීටොම්ස් ගිවිසුමත් එය ක්‍රියාත්මක කිරීමත් සඳහා මාස ගනනක් තිස්සේ බල කරමින් සිටි එල්ටීටීඊය

අධිකරන තීන්දුවට කෝපාන්විතව ප්‍රතිචාර දක්වී ය. ''අපි පීටොම්ස් ගිවිසුම ගැන තව දුරටත් උනන්දු නො වන්නෙමු. මහ ව්‍යසනයකින් කරදරයට පත් ජනයාට උදව් කිරීමට ඇති කර ගත් ගිවිසුම ශ්‍රී ලාංකික අධිකරනය මගින් අත් හිටුවා තිබෙනවා. ශ්‍රී ලංකාවේ අධිකරනය දෙමල ජනයාට සාධාරනය ඉටු කිරීම ප්‍රතික්ෂේප කල පලමු අවස්ථාව මෙය නො වන අතර එය පුදුමයට කරුනක් ද නො වෙයි'' යයි එල්ටීටීඊ දේශපාලන අංශ නායක එස්. පී. තමිල්සෙල්වන් ප්‍රකාශ කලේ ය.

''මූලික යථාර්ථය පිලිබඳව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමටත් එල්ටීටීඊය වෙත සෘජුව ම ආධාර එවීමේ තීරනය ගන්නා ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටීමටත් විශාල ආයාසයක්'' එල්ටීටීඊය දරනු ඇති බව තමිල්සෙල්වන් කීය. සුනාමි ආධාර තමන්ගේ ම දේශපාලන අභිමතාර්ථයයන්ට -- කලාපය තුල තම ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවලට තර්ජනය කරන දිගු කාලීන සිවිල් යුද්ධය අවසන් කිරීම සඳහා බලය බෙදන ගනුදෙනුවක් සඳහා -- ගැටගසා ඇති එක්සත් ජනපද, බ්‍රිතාන්‍ය, ජපන් හා අනෙකුත් ප්‍රධාන බලවතුන්ට කරන හිස් ආයාචනාවලට මෙයත් එකතු වේ.

අධිකරන තීන්දුව මතු කර දක්වන්නේ මතුවී ඇති සමහන් කල නොහැකි දේශපාලන හිරවීම යි. දිවයින ලාභ ශ්‍රම වේදිකාවක් හා දකුනු ආසියාවට එන ආයෝජනවල දොරටුවක් බවට පරිවර්තනය කර ගැනීමේ උපායක් ලෙස යුද්ධය අවසන් කරන ලෙස ප්‍රධාන බලවතුන්ගේ පිටු බලය ලබන කොලඹ ව්‍යාපාරික ප්‍රභූ තන්ත්‍රයේ කොටස් අවධාරනය කර තිබේ. එසේ වුවත් 20 අවුරුදු යුද්ධය රාජ්‍ය තන්ත්‍රයේ සෑම කොටසක් තුලම -- මිලිටරිය, අධිකරනය හා රාජ්‍ය නිලධරය -- බලගතු බැඳීම් නිර්මානය කර ඇති අතර එම සෑම කොටසක් ම ගැඹුරින් ම සිංහල ස්වෝත්තමවාදයේ ගිලී සිටිති.

සාම ප්‍රයත්නය යලි ඇරඹීමටත් එල්ටීටීඊය සමග සාකච්ඡා කිරීමටත් ගන්නා ඕනෑම ප්‍රයත්නයක් ජවිපෙ හා ජාතික හෙල උරුමය වැනි විවෘත වර්ගවාදී පක්ෂවලින් පමනක් නොව ප්‍රධාන පක්ෂ, මාධ්‍ය හා රාජ්‍යයෙන්ද තියුනු ප්‍රතික්‍රියාවක් අවුලුවනු ඇත. සුනාමි ආධාර පිලිබඳව එල්ටීටීඊය සමග ගනුදෙනුවකට එලඹීමට ආධාර දෙන රටවල් විසින් තල්ලු කරනු ලැබීමට පෙර මාස ගනනක් තිස්සේ කුමාරතුංග එය කල් දමමින් සිටියා ය. ඇයගේ ආන්ඩුව පාර්ලිමේන්තුව තුල සුලුතරයක් බවට පත් කරමින් ජවිපෙ ආන්ඩුවෙන් ඉවත්වීමට හා එමගින් දේශපාලන සංස්ථාපිතය තුල ගැඹුරු භේදයන් විවෘත කිරීමට ඇයගේ තීරනය හේතු විය.

නව මැතිවරනයකින් මෙම අර්බුදය විසඳනු ලැබේ යයි කිසිදු දේශපාලන පක්ෂයක් විශ්වාස කරන්නේ නැත. ජීවන තත්වයන් නොකඩවා පිරිහීමට පත් කරන ආර්ථික ප්‍රතිව්‍යුහකරන පියවරයන් ක්‍රියාවට දමා ඇති සමස්ත දේශපාලන පර්යාය කෙරෙහි ම ජනගහනයේ විශාල කොටස් විරුද්ධ වෙති. රාජ්‍ය තන්ත්‍රය පාලනය කිරීමේ වාසිය සියතට ගැනීමට කටුක අරගලයක නිමග්න වී සිටින තරගකාරී පාලක ප්‍රභූවේ කොටස් තම අභිප්‍රායන් වෙත ලඟාවීම සඳහා යන ගමන කිසිවකින් නතර නො කරනු ඇත. විධායක ජනාධිපති ධුරයේ බලතල ශ්‍රේෂ්ඨාධිකරනය මගින් අනුමත කලේ ය යන කරුන පෙන්නුම් කරන්නේ ධනේශ්වර පාලනයේ රඳා පැවැත්ම සඳහා එම බලතල අත්‍යාවශ්‍ය බවයි.

පසු ගිය සතියේ සිදු වූ විදේශ ඇමතිවරයාගේ ඝාතනය පිලිබඳව එල්ටීටීඊය මත, මාධ්‍ය හා දේශපාලන සංස්ථාපිතය වහාම වරද පැටවී ය. එල්ටීටීඊය ඝාතනය පිලිබඳ වගකීම ප්‍රතික්ෂේප කර ඇතත් එවැන්නක් කිරීමට එයට සෑම අතින් ම හැකියාව ඇත. කෙසේ වුවද පීටොම්ස් ගිවිසුම පිලිබඳව කොලඹ පවතින තියුනු ගැටුමක තතු තුල ආධාර ගිවිසුමට වල කැපීමටත් වාර්ගික ආතතීන් අවුලුවා ලීමටත් සිංහල ස්වෝත්තමවාදී සංවිධාන සමග සහයෝගීව මිලිටරියේ විවිධ කන්ඩායම් මෙම ඝාතනය සංවිධානය කලා වන්නට ද පුලුවන. එය එසේ වේ නම්, පාලන තන්ත්‍රය අතර පවතින නොඑකඟතාවන් සමහන් කිරීමට පමනක් නොව කම්කරු ජනයාගෙන් එන ඕනෑම විරුද්ධත්වයක් තලා දැමීම සඳහා භාවිතයට දමනු ඇත්තා වූ අනුකම්පා විරහිත විධික්‍රම පිලිබඳ අනතුරු හැඟවීමකි.

© www.wsws.org